2020.02.04 ලංකාදීප II පිටුව 04

නිදහසින් පසු ආර්ථික යථාර්ථය

ජ්‍යෙෂ්ඨ ආර්ථික විශ්ලේෂක

වින්සන් මර්වින් ප්‍රනාන්දු

අද අපි 72වැනි නිදහස සමරන්නෙමු. මේ මොහොත වන විට සමස්ත ශ්‍රී ලාංකික සමාජයේ දුම්කාණ්ඩ [illegible] "හඬපට" සහ, මුළු ලොවටම බලපාන [illegible] "කොරෝනා වයිරසය" ශ්‍රී ලංකාවටද කරන බලපෑම ගැන කතාකරන අතර නව පාලන ආණ්ඩුව යටතේ, රාජපක්ෂ ආණ්ඩු සමයේත් සිදුවූවාය කියන [illegible] මහා ගැන හෙළිකරන "වෝහාරික විගණන වාර්තාව" ගැනත් කතාකරමින් සිටින්නෙමු. අප සම [illegible] නිදහසින් පසු බිහිවූ සෑම ආණ්ඩුවක් යටතේම [illegible] වැඩි වශයෙන් විවිධ දූෂණයන් සිදුවූ බවය. ලෝක බැංකුව පවා ප්‍රකාශ කරන්නේ සෑම රටකම [illegible] සියයට 40ක් ම දූෂිත බවය.

එසේ නම් 1948 පෙබරවාරි 4දා නිදහස් ලද දා සිට මෙරටට පත් විවිධාකාරයේ දූෂණයන් සහිත ශ්‍රී ලංකාවේ ආණ්ඩුවලින් කොයි ආණ්ඩුව රටම වැදගත් [illegible] තීරණය කිරීමට අපට යොදාගත හැක්කේ "කවර ආර්ථික අර්බුද" ඉටුකරගැනීමට ඒ ඒ ආණ්ඩු [illegible] දුරට ප්‍රායෝගික වූවාද යන්න විමසීමෙන් පමණි. [illegible] සඳහා අපි රටක සියලුම ආර්ථික ක්‍රියාකාරිත්වය [illegible] දක්වන මිනුම් වන "ආර්ථික වර්ධන වේගය" හා ඒ හා බැඳි පුද්ගල ආදායම" යන සංකල්ප දෙක පමණක් යොදා ගනිමු.

නිදහසින් පසු ලංකාවේ පාලන බලය මුලින්ම හිමිකර ගත් එක්සත් ජාතික පක්ෂයේ නායකයින් වන ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක හා සර් ජෝන් කොතලාවල යන මහතුන් "1948-1955 දක්වා කාලය තුළ" රට පාලනය කළ අතර ඔවුන් අනුගමනය කළේ "යටත් විජිතවාදී විවෘත ආර්ථිකය" සමඟ ජනප්‍රියවාදී ආර්ථික ප්‍රතිපත්තියකි. මේ යටතේ සිදුකළ සියලුම ආර්ථික ක්‍රියාකාරකම්වලින් එම කාලය තුළ ඔවුන් රට ඉදිරියට තල්ලු කළේ සියයට 4.2කිනි. රටේ ජනතාවගේ ඒක පුද්ගල ආදායම වැඩිකර දුන්නේ ඩොලර් 120 සිට 138 දක්වා ඩොලර් 18කින් පමණි. එම කාලය තුළ වැඩිම වර්ධන වේගය වූ සියයට 6.2ක වාර්තාවූයේ 1951 දී පමණි. මේ කාලය තුළ සුබසාධන ප්‍රතිපත්තිවලට වැඩි ප්‍රමුඛතාවක් දුන්නේය.

ඊළඟට රට පාලනය කළ මහජන එක්සත් පෙරමුණ (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ) නායකයන් වන එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක සහ විජයානන්ද දහනායක යන මහත්ම මහත්මීන් "1956-1964 දක්වා කාලය තුළ" ශ්‍රී ලංකා ආර්ථිකය ඉදිරියට තල්ලු කළේ සියයට [illegible] තරම් අඩු ප්‍රතිශතයකිනි. රටේ ඒක පුද්ගල ආදායම වැඩි කර දුන්නේ ඩොලර් 138 සිට 150 දක්වා ඩොලර් 12කින් පමණි. මේ කාලය තුළ "රාජ්‍ය ධනවාදය" ක්‍රියාත්මක වූ අතර දේශීය කාර්මීකරණය ඉලක්ක කරගත් "ආනයන ආදේශක කාර්මීකරණය" නම් [illegible] සංවර්ධන උපාය මාර්ගයට වැඩි පැහැක් දුන්නේය. මේ කාලය තුළ හොඳ ආර්ථික වර්ධන වේගය වූ සියයට 6.7 වාර්තාවූයේ 1960 දීය.

1965 සිට 1969 දක්වා කාලය තුළ යළිත් බලයට පැමිණියේ ඩඩ්ලි සේනානායක මහතා යටතේ එක්සත් ජාතික පක්ෂයයි. ඔහු සීමිත ප්‍රමාණයක නිර්බාධ ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර රාජ්‍ය කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගය අඩපණ කළේය. ආර්ථිකය තුළ පෞද්ගලික අංශයට වැඩි කාර්යභාරයක් පවරා දුන්නේය. ඔහු ගේ කාලයේ රට ඉදිරියට ගියේ සියයට 5.3 කිනි. එය එහෙත් ඉදිරියට ගිය වැඩිම වේගය වුවත් ඒක පුද්ගල ආදායම වැඩිවූයේ ඩොලර් 150 සිට 160 දක්වා ඩොලර් 10කින් පමණි. මේ කාලය තුළ වැඩිම වර්ධන වේගය වූ සියයට 8.2 වාර්තා වූයේ 1968 දීය.

1970 - 77 කාලය තුළ" සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ හවුල් ආණ්ඩුවක් බිහිවූ අතර ආර්ථික ප්‍රතිපත්තිය ලෙස යළිත් සංවෘත ආර්ථිකය සමඟ ආනයන ආදේශක කාර්මීකරණයට යොමුවිය. ප්‍රථම ත්‍රස්තවාදී ප්‍රහාරය වූ 1971 කැරැල්ල ඇතිවූයේ මේ කාලයේදීය. මේ යුගයේ රට ඉදිරියට ගියේ සියයට 2.9ක් තරම් අඩු ප්‍රතිශතයකින් වුවත් ඒක පුද්ගල ආදායම ඩොලර් 160 සිට 294 දක්වා ඩොලර් 134කින් වැඩිවීම නිදහසින් පසු කැපී පෙනෙන වැඩිවීමක් විය.

"[illegible] ආර්ථික ප්‍රතිපත්ති ප්‍රමුඛ කොටගත් 1948-1977 කාලය තුළ රටේ ආර්ථික වර්ධනය හෙවත් රට ඉදිරියට තල්ලුවීම අඩු මට්ටමක් ගැනීම නිසා සහ ඒක පුද්ගල ආදායම ඩොලර් 120 සිට 294 දක්වා වසර 30ට ම ඩොලර් 174කින් (වසරකට ඩොලර් 6 ක් තරම් අඩු මට්ටමකින්) ඉහළයාම නිසා නිදහස ලැබෙන කාලයේ අපට පසුපසින් සිටි ආසියාතික රටවල් බොහොමයක් අපව පසුකරගෙන ඉදිරියට ගියේය.

එසේ ඉදිරියට ගියේ "විවෘත ආර්ථික ප්‍රතිපත්තියක්" එක දිගටම අනුගමනය කළ නිසා බව පෙනේ. ජේ.ආර්. ජයවර්ධන ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂය "1978-2004 දක්වා" වන දිගටම දිගුකාලයක් රට පාලනය කළේය. ඒ කාලය තුළ ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග රට පාලනය කළ අතර අවසාන කාලය වන විට අගමැති රනිල් වික්‍රමසිංහ සමඟ චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමිය රට පාලනය කළේ "ආර්ථික නිර්බාධකරණය" (විවෘත ආර්ථික) ප්‍රතිපත්තිය යටතේය. පෞද්ගලික අංශය දිරිමත් කරන රාජ්‍ය අංශය අඩපණ කරන, නිදහස් වෙළෙඳ කලාප, විදේශ සෘජු ආයෝජන දිරිමත් කරන එම ආර්ථික ක්‍රමය සමඟ රට ඉදිරියට තල්ලුවූයේ (1978-2004 කාලය තුළ) සියයට 4.8 ක් ලෙසය. [illegible] රට දැවැන්ත යුද්ධයකට තල්ලුවිමය.

ඇතැම් විචාරකයින් ප්‍රකාශකරන ආකාරයට රට ඉණුවෙන්නට පටන් ගත්තේ 1978 න් පසුවය. එහෙත් ඒක පුද්ගල ආදායම ඩොලර් 294 සිට 1063 දක්වා ඩොලර් 769 කින් (වසරකට ඩොලර් 30කින් පමණ) වැඩිවූයේ මේ කාලයේදීය. මේ කාලය තුළ වැඩිම වර්ධන වූ සියයට 8.2 වාර්තාවූයේ 1978 දීය.

2005-2014 කාලය තුළ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන කාලය ආරම්භ වූ අතර "ආරක්ෂණවාදය, ජාතික ආර්ථික ප්‍රතිපත්ති සහ යටිතල පහසුකම් සංවර්ධනය පමණක් නොව එවක මහ බැංකු අධිපති ලෙස ක්‍රියාකළ අජිත් නිවාඩ් කබ්රාල් මහතා යටතේ මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වූ "මිල ස්ථායීතාව" භාරටක ලෙස ප්‍රකාශ කරමින් රටේ උද්ධමන වේගය තනි මැදි ඉලක්කමක් බවට පත්කොට එය මේ දක්වාම ගෙන ඒමට අවශ්‍ය [illegible] කළේය. එසේම 2005-14 කාලය තුළ රට ඉදිරියට ගෙන ඒම සියයට 6ක් බවට පත්කරමින් (2010-8%ක්, 2011-8.4%, 2012-9.1% සහ වාර්තා සමඟ) ඒක පුද්ගල ආදායම ඩොලර් 1242 සිට 3821 දක්වා ඩොලර් 2579ක් (වසර ඩොලර් 288ක්) දක්වා වැඩිකරමින් 1948-2020 දක්වා කාලය තුළ, එනම් නිදහසින් පසු වසර 72 ක කාලයක් තුළ රටේ හොඳම ආර්ථික ප්‍රගතිය වාර්තා කළ ආණ්ඩු බවට වාර්තාවක් තබා ඇත. මේ නිසාම 2015-2019 දක්වා කාලය තුළ රට පාලනය කළ යහ පාලන ආණ්ඩු කාලය තුළ රට ඉදිරියට යෑම 4%කට වඩා අඩු මට්ටමකට වැටුණු අතර (2015 සිට 2019 දක්වා වර්ධන ක්‍රමයෙන් අඩුවී) ඒක පුද්ගල ආදායම ඩොලර් 3821 සිට 4200 දක්වා ඩොලර් 379කින් (වසරකට 76ක්) පමණක් වැඩිකර දුන්නේය. එසේම පාස්කු ඉරිදා ප්‍රහාරය සමඟ රටේ ආරක්ෂාව බිඳවැටුණේය. ඒ අතර මහ බැංකුව අපකීර්තියට පත්කරමින් දැවැන්ත බැඳුම්කර හොරකමක් සිදුකොට රට මිල කළ නොහැකි දැවැන්ත විනාශයක් යහ පාලන ආණ්ඩුව යටතේ සිදුවිය.

කෙසේ වෙතත් නිදහස ලැබූ වසර 72ක පිරෙන මේ මොහොතේ කවුරු කවුරුත් මේ පිළිබඳව ගැඹුරින් සිතා බලා අතීතයේදී සිදුවූවාය කියන දූෂණ අවම කොට අද රට වැටී තිබෙන ආර්ථික අගාධයෙන් රට ගොඩගැනීමට කටයුතු කිරීමට උත්සාහ කරන මෙන් මේ නිදහස් දිනයේදී සියලුම දේශපාලනාධිකාරින්ගෙන් මෙරට ජනතාව ඉල්ලා සිටින බව අවසාන වශයෙන් සඳහන් කරමු.